66067

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2015

ගිණුම්කරණය I
கணக்கீடு I
Accounting I

33 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* අංක **1** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා **එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**
* අංක **31** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු **අදාළ තිත් ඉරි මත ලියන්න.**
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු **දෙක** බැගින් හිමි වේ.
* **විභාග අංකය**, ඉහළින් ඇති කොටුවේ පැහැදිලි ව සටහන් කරන්න.

**විභාග අංකය :** ..............................

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංකය | ලකුණු |
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

| | අත්සන | සංකේත අංක |
|---|---|---|
| 1 වන පරීක්ෂකගේ | | |
| 2 වන පරීක්ෂකගේ | | |
| අති/ප්‍රධාන පරීක්ෂකගේ | | |
| ගණිත පරීක්ෂකගේ | | |
| ප්‍රධාන පරීක්ෂකගේ | | |

**1.** පහත දැක්වෙන කුමන ප්‍රකාශය ආයතනයක මූල්‍ය ගිණුම්කරණයේ මූලික කාර්යභාරය සම්බන්ධයෙන් **නිවැරදි** වේ ද?
(1) එය ආයතනයක ගනුදෙනු, මූල්‍ය පදනම මත ගිණුම් පොත්වල වාර්තා කරයි.
(2) එය ආයතනයක කළමනාකරුවන්ගේ භාවිතය සඳහා විශේෂිත පරමාර්ථ මූල්‍ය වාර්තා පිළියෙල කරයි.
(3) එය ආයතනයක් පිළිබඳ ව ඇල්මක් දක්වන පාර්ශ්වයන්ගේ භාවිතය සඳහා පොදු පරමාර්ථ මූල්‍ය වාර්තා පිළියෙල කරයි.
(4) එය ආයතනයක අයිතිකරුවන්ට තීරණ ගැනීම සඳහා අතීත සහ අනාගත තොරතුරු සපයයි.
(5) එය ආයතනයක වාර්ෂික විගණනයට අවශ්‍ය මූල්‍ය තොරතුරු සපයයි. (......)

**2.** පහත කාර්යයන් ගිණුම්කරණ ක්‍රියාවලිය තුළ සිදුවන **නිවැරදි** අනුපිළිවෙළ කුමක් ද?

A - ගනුදෙනු සිදු වීම
B - ජර්නල් සටහන් ලෙජරයට පිටපත් කිරීම
C - ගනුදෙනු මූලික පොත්වල සටහන් කිරීම
D - ශේෂ පිරික්සුම පිළියෙල කිරීම
E - ලෙජර ගිණුම් තුලනය කිරීම

(1) A, B, C, E, D (2) A, C, B, E, D (3) C, A, B, E, D (4) C, B, A D, E (5) C, B, A, E, D (......)

**3.** එක් එක් කාලච්ඡේදයේ ක්ෂය ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලබන්නේ කුමන ගිණුම්කරණ සංකල්පයට අනුකූලව ද?
(1) උපචිත (2) අඛණ්ඩ පැවැත්ම (3) ගැළපුම් (4) උපලබ්ධි (5) ආරක්ෂණ (......)

**4.** භාණ්ඩ ගනුදෙනුකරුවන්ට බෙදාහරින අවස්ථාවේ දී විකුණුම් අයභාරය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගැනීම සඳහා පහත කුමන ගිණුම්කරණ සංකල්පය පදනම් වන්නේ ද?
(1) උපචිත (2) ගැළපුම් (3) කාලච්ඡේද (4) ආරක්ෂණ (5) උපලබ්ධි (......)

**5.** ශ්‍රී ලංකාව තුළ අනුගමනය කරන 'මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට' අනුව පහත කුමන දෑ මූල්‍ය තොරතුරුවල **මූලික** ගුණාත්මක ගතිලක්ෂණ ලෙස සලකනු ලබයි ද?
(1) අදාළ බව සහ සත්‍යාපනය කළ හැකි බව
(2) විශ්වසනීය බව සහ කාලීන බව
(3) අවබෝධ කරගත හැකි බව සහ සංසන්දනාත්මක බව
(4) සංසන්දනාත්මක බව සහ විශ්වසනීය නියෝජනය
(5) අදාළ බව සහ විශ්වසනීය නියෝජනය (......)

**6.** ආයතනයක් විසින් ලකුණු කළ මිල රු. 600 000 ක් වූ භාණ්ඩ 5% ක වෙළෙඳ වට්ටමකට යටත් ව ණයට මිලදී ගෙන පසුව රු. 650 000 ක අත්පිට මුදලට විකුණන ලදී. ණයහිමියන්ට ගෙවිය යුතු මුදල මේ දක්වා පියවා නොමැත. මෙම ගනුදෙනුවල **ශුද්ධ බලපෑම** ගිණුම්කරණ සමීකරණයේ නිරූපණය කරනුයේ:

| | වත්කම් | වගකීම් | හිමිකම් |
|---|---|---|---|
| (1) | රු. 50 000 කින් වැඩි වේ. | – | රු. 50 000 කින් වැඩි වේ. |
| (2) | රු. 80 000 කින් වැඩි වේ. | – | රු. 80 000 කින් වැඩි වේ. |
| (3) | රු. 80 000 කින් වැඩි වේ. | රු. 570 000 කින් අඩු වේ. | රු. 650 000 කින් වැඩි වේ. |
| (4) | රු. 650 000 කින් වැඩි වේ. | රු. 570 000 කින් වැඩි වේ. | රු. 80 000 කින් වැඩි වේ. |
| (5) | රු. 650 000 කින් වැඩි වේ. | රු. 600 000 කින් වැඩි වේ. | රු. 50 000 කින් වැඩි වේ. (......) |

**7.** සීමිත තනුජා පොදු සමාගමේ 2015.03.31 දිනට ණයහිමි පාලන ගිණුමේ ශේෂය රු. 360 000 ක් විය. එදිනට ණයහිමි ලෙජරයට අනුව ණයහිමි ශේෂයන්ගේ එකතුව රු. 406 000 ක් විය. පසුව කරන ලද විමර්ශනයේ දී පහත දෑ හෙළිදරව් විය:

* සැපයුම්කරුවකු විසින් නියමිත දිනට නොපිය වූ ශේෂයක් මත අයකරන ලද රු. 10 000 ක පොලිය, ණයහිමි ලෙජරයේ පමණක් සටහන් කර තිබුණි.
* ගැනුම් ජර්නලයේ එකතුව වූ රු. 62 000, ණයහිමි පාලන ගිණුමේ රු. 26 000 ක් ලෙස සටහන් කර තිබුණි.
* ණයහිමියකුට ගෙවූ රු. 28 000 ක්, ණයහිමි පාලන ගිණුමෙහි මෙන් ම ණයහිමි ලෙජරයේ ද සටහන් කර නොතිබුණි.

2015.03.31 දිනට ණයහිමි පාලන ගිණුමේ **නිවැරදි** ශේෂය:
(1) රු. 358 000 (2) රු. 368 000 (3) රු. 378 000 (4) රු. 404 000 (5) රු. 406 000 (......)

[දෙවැනි පිටුව බලන්න.

tamilguru.lk

**8.** සීමිත චතුර පොදු සමාගමේ 2015.03.31 දිනට ශේෂ පිරික්සුම තුලනය නොවී ය. පසුව කරන ලද විමර්ශනයේ දී පහත දෑ හෙළිදරව් විය:
- අත්පිට විකුණුම් රු. 100 000 ක් මුදල් පොතේ පමණක් සටහන් කර තිබුණි.
- ගැනුම් ජර්නලය රු. 60 000 ක් අඩුවෙන් එකතු කර තිබුණි.
- බොල් ණය ආපසු ලැබීම් රු. 30 000 ක් වියදමක් ලෙස වාර්තා කර තිබුණි.
- රු. 10 000 ක පොලී ආදායමක් පොලී ආදායම් ගිණුමේ දෙවරක් බැර කර තිබුණි.

ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර අවිනිශ්චිත ගිණුමේ ශේෂය:
(1) රු. 90 000 හර (2) රු. 90 000 බැර (3) රු. 130 000 බැර
(4) රු. 150 000 හර (5) රු. 150 000 බැර (……)

**9.** පහත තොරතුරු 2015 මාර්තු මාසය සඳහා සමාගමක තොග අයිතමයකට අදාළ වේ.

| දිනය | විස්තරය | ප්‍රමාණය (ඒකක) | ඒකක පිරිවැය (රු.) |
|---|---|---|---|
| 2015.03.01 | ශේෂය | 1 000 | 60 |
| 2015.03.20 | ගැනුම් | 3 000 | 80 |
| 2015.03.31 | විකුණුම් | 2 000 | |

සමාගම තොග නිකුත් කිරීම් මිල කිරීම සඳහා 'පෙර-පිවිසි පෙර-පිට' (FIFO) ක්‍රමය භාවිත කරයි. 2015.03.31 දිනට තොග ඒකකයක ශුද්ධ උපලබ්ධි අගය රු. 70 ක් විය.
LKAS 2 (තොග) ප්‍රමිතයට අනුව, 2015.03.31 දිනට තොගයේ පිරිවැය සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ නිරූපණය කළ යුතු එහි ධාරණ වටිනාකම කොපමණ ද?

| | පිරිවැය (රු.'000) | ධාරණ වටිනාකම (රු.'000) |
|---|---|---|
| (1) | 140 | 140 |
| (2) | 140 | 160 |
| (3) | 150 | 140 |
| (4) | 160 | 140 |
| (5) | 160 | 160 |

More Past Papers at
tamilguru.lk

(……)

**10.** LKAS 16 (දේපළ, පිරියත සහ උපකරණ) ප්‍රමිතයට අනුව දේපළ, පිරියත සහ උපකරණ නිර්වචනය කිරීමට අදාළ ව පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?
A - ඒවා ස්පෘශ්‍ය අයිතම වේ.
B - ඒවා භාණ්ඩ නිෂ්පාදනය කිරීමට හෝ සේවා සැපයීමට හෝ පරිපාලන කාර්යයන් සඳහා භාවිත කිරීමට පවත්වා ගැනේ.
C - ඒවා එක් මූල්‍ය වර්ෂයකට වඩා වැඩි කාලයක් භාවිතයට ගැනීමට අපේක්ෂා කෙරේ.
(1) A පමණි. (2) A හා B පමණි. (3) A හා C පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C යන සියල්ල ම. (……)

**11.** එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි ව්‍යාපාරයක් 2015.03.31 දින අත්පත් කරගත් යන්ත්‍රයකට පහත තොරතුරු අදාළ වේ.

| | රු. |
|---|---|
| VAT ඇතුළු ව ගෙවූ මිල | 777 000 |
| වරායේ සිට ව්‍යාපාර ස්ථානයට ප්‍රවාහනය කිරීමේ පිරිවැය | 40 000 |
| වැඩබිම සකස් කිරීමේ පිරිවැය | 120 000 |
| සවිකිරීමේ පිරිවැය | 80 000 |
| සමාරම්භක උත්සවයේ වියදම් | 30 000 |
| යන්ත්‍රයේ මූලික පරීක්ෂා කිරීමේ පිරිවැය | 10 000 |

අදාළ VAT අනුපාතය 11% කි.
LKAS 16 (දේපළ, පිරියත සහ උපකරණ) ප්‍රමිතයට අනුව ආරම්භක හඳුනාගැනීමේ දී යන්ත්‍රයේ පිරිවැය:
(1) රු. 931 530 (2) රු. 950 000 (3) රු. 971 530 (4) රු. 980 000 (5) රු. 1 027 000 (……)

**12.** 2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන සමාගමක වැටුප් ලේඛනයෙන් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

| විස්තරය | සේවක වර්ගය: නිෂ්පාදන සේවකයන් (රු.'000) | නිෂ්පාදන සුපරීක්ෂකවරුන් (රු.'000) |
|---|---|---|
| මූලික වැටුප | 4 000 | 2 000 |
| දිරි දීමනා ගෙවීම් (නිම කරන ලද විශේෂිත ඇණවුමක් සඳහා කෑලි පදනම මත) | 1 500 | – |
| අතිකාල දීමනා | – | 800 |
| ප්‍රසාද දීමනා (සමාගමේ ලාභ පදනම් ව) | 200 | 100 |
| **දළ වැටුප** | **5 700** | **2 900** |
| අඩු කිරීම්: EPF දායකය (10%) | 400 | 200 |
| **ශුද්ධ වැටුප** | **5 300** | **2 700** |
| සමාගමේ දායකත්වයන්: | | |
| EPF (15%) | 600 | 300 |
| ETF (3%) | 120 | 60 |

2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ සෘජු වේතන සහ නිෂ්පාදන පොදු කාර්යය පිරිවැය තුළ අන්තර්ගත වැටුප් අගයන් කොපමණ ද?

| | සෘජු වේතන (රු.'000) | නිෂ්පාදන පොදු කාර්යය පිරිවැයේ අන්තර්ගත වැටුප (රු.'000) |
|---|---|---|
| (1) | 5 300 | 2 700 |
| (2) | 5 500 | 2 800 |
| (3) | 5 700 | 2 900 |
| (4) | 6 220 | 3 160 |
| (5) | 6 420 | 3 260 |

(……)

[තුන්වැනි පිටුව බලන්න.

**13.** 2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්‍රීඩා සමාජයක සාමාජික මුදල්වලට අදාළ තොරතුරු පහත දැක්වේ.

2014/2015 වර්ෂය තුළ දී ලද සාමාජික මුදල්වල සංයුතිය:

| වසර | රු. |
|---|---|
| 2013/2014 | 9 000 |
| 2014/2015 | 50 000 |
| 2015/2016 | 20 000 |
| | **79 000** |

| | **2015.03.31 දිනට (රු.)** | **2014.03.31 දිනට (රු.)** |
|---|---|---|
| ලැබිය යුතු සාමාජික මුදල් | 15 000 | 10 000 |
| කලින් ලද සාමාජික මුදල් | ? | 10 000 |

2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගත් සාමාජික මුදල් ආදායම කොපමණ ද?

(1) රු. 50 000 (2) රු. 74 000 (3) රු. 79 000 (4) රු. 84 000 (5) රු. 94 000 (......)

● **ප්‍රශ්න අංක 14 සහ 15 ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

ලාල්, නීල් සහ රාජු ලාභාලාභ සමසමව බෙදා ගන්නා ව්‍යාපාරයක හවුල්කරුවන් වේ. 2014.04.01 දිනට හවුල් ව්‍යාපාරයේ ප්‍රාග්ධන සහ ජංගම ගිණුම්වල ශේෂයන් පහත පරිදි විය.

රු.'000

| **ගිණුම** | **ලාල්** | **නීල්** | **රාජු** |
|---|---|---|---|
| ප්‍රාග්ධන | 3 000 | 2 000 | 1 000 |
| ජංගම | 600 | 400 | 200 |

More Past Papers at
tamilguru.lk

2015.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී හවුල් ව්‍යාපාරය රු. 2 700 000 ක ලාභයක් ඉපැයී ය. සෑම හවුල්කරුවකු ම රු. 400 000 ක වාර්ෂික වේතනයකට සහ ඔවුන්ගේ ආරම්භක ප්‍රාග්ධන ශේෂයන් මත 10% ක පොලියකට හිමිකම් ලබයි.

ප්‍රවර්තන වර්ෂය තුළ දී හවුල්කරුවන්ගේ ගැනිලි: ලාල් රු. 60 000, නීල් රු. 40 000 සහ රාජු රු. 30 000.

2015.03.31 දින රාජු හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගන්නා ලදී. මෙදිනට ඔහුගේ කීර්තිනාම කොටස රු. 200 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. රාජුට ගෙවිය යුතු මුදල ණය ගිණුමකට මාරු කරන ලදී.

**14.** 2015.03.31 දිනට ලාල් සහ නීල්ගේ ජංගම ගිණුම්වල ශේෂයන්:

| | **ලාල් (රු.'000)** | **නීල් (රු.'000)** |
|---|---|---|
| (1) | 1 540 | 1 260 |
| (2) | 1 600 | 1 300 |
| (3) | 2 130 | 1 850 |
| (4) | 2 140 | 1 860 |
| (5) | 2 190 | 1 890 |

(......)

**15.** 2015.03.31 දිනට ලාල්ගේ ප්‍රාග්ධන ගිණුමේ ශේෂය සහ රාජුගේ ණය ගිණුමේ ශේෂය:

| | **ප්‍රාග්ධන ගිණුම - ලාල් (රු.'000)** | **ණය ගිණුම - රාජු (රු.'000)** |
|---|---|---|
| (1) | 2 900 | 1 200 |
| (2) | 2 900 | 2 170 |
| (3) | 2 900 | 2 770 |
| (4) | 3 000 | 1 200 |
| (5) | 3 000 | 2 170 |

(......)

**16.** සීමිත නාලන්ද පොදු සමාගමේ 2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂකවරු විසින් 2015.05.15 දින අනුමත කරන ලදී. සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම 2015.05.30 දින පවත්වන ලදී. 2015.03.31 දිනට පසුව පහත සඳහන් සිද්ධීන් සමාගමේ සිදු විය.

A - 2015.03.31 දිනට රු. 750 000 ක් ගෙවිය යුතු ණයගැතියකු 2015.04.20 දින බුන්වත් බව ප්‍රකාශ කරන ලදී.
B - 2015.03.31 දිනට පිරිවැය රු. 800 000 ක් වූ තොගයක් 2015.04.30 දින රු. 720 000 කට විකුණන ලදී.
C - 2015.03.31 දිනට රු. 500 000 ක වගකීමක් ඇති බව තහවුරු කරමින් 2015.05.25 දින නඩු තීන්දුවක් ලබා දෙන ලදී.
D - 2015.05.15 දින සාමාන්‍ය කොටසකට රු. 3 බැගින් වූ අවසාන ලාභාංශයක් ප්‍රකාශයට පත් කරන ලදී.

LKAS 10 (වාර්තා කරන කාල පරිච්ඡේදයකට පසු සිදුවීම්) ප්‍රමිතයට අනුව 2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ඉහත කුමන සිද්ධීන් ගැළපිය යුතු ද?

(1) A හා B පමණි. (2) C හා D පමණි. (3) A, B හා C පමණි.
(4) B, C හා D පමණි. (5) A, B, C හා D යන සියල්ලම. (......)

**17.** LKAS 37 (ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්) ප්‍රමිතයට අනුව පහත කුමන අයිතම සමාගමක මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ප්‍රතිපාදන ලෙස හඳුනා ගැනේ ද?

A - අඩමාණ ණය සඳහා වෙන් කිරීම් B - සේවක වන්දි ඉල්ලීමක් සඳහා වෙන් කිරීම්
C - ක්ෂය සඳහා වෙන් කිරීම් D - වගකීම් සහතික මත ඉල්ලුම් සඳහා වෙන් කිරීම්

(1) A හා D පමණි. (2) B හා D පමණි. (3) A, B හා C පමණි.
(4) B, C හා D පමණි. (5) A, B, C හා D යන සියල්ලම. (......)

**18.** 2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමකට අදාළව පහත තොරතුරු දී ඇත.

| **විස්තරය** | **රු.'000** |
|---|---|
| වර්ෂය සඳහා ලාභය | 750 |
| වර්ෂය සඳහා ආදායම් බදු වෙන් කිරීම | 50 |
| කාර්යාල උපකරණයක් විකිණීමෙන් ඇති වූ අලාභය | 20 |
| ගෙවූ ආදායම් බදු | 20 |
| කාර්යාල උපකරණ මත ක්ෂය | 70 |
| තොගයේ වැඩි වීම | 230 |
| වෙළෙඳ ණයහිමියන්ගේ අඩු වීම | 120 |

LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) ප්‍රමිතයට අනුව 2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් කටයුතු තුළින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය කොපමණ ද?

(1) රු. 470 000 (2) රු. 520 000 (3) රු. 540 000 (4) රු. 1 170 000 (5) රු. 1 220 000 (……)

● **2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත අමල් පොදු සමාගමට අදාළ පහත තොරතුරු ප්‍රශ්න අංක 19 සහ 20 ට පිළිතුරු සැපයීමට භාවිත කරන්න.**

| **විස්තරය** | **රු.'000** |
|---|---|
| විකුණුම් අයභාරය | 1 000 |
| මෝටර් රථ ප්‍රත්‍යාගණනය මත අතිරික්තය | 200 |
| සැපයුම්කරුවන්ගෙන් ලද වෙළෙඳ වට්ටම් | 100 |
| ගොඩනැගිල්ලක් විකිණීම මත ලාභය | 300 |
| මුළු වියදම | 500 |

More Past Papers at
tamilguru.lk

2014.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෝටර් රථ ප්‍රත්‍යාගණනය මත රු. 150 000 ක හිඟයක් ඇති වූ අතර සමාගම එය වියදමක් ලෙස හඳුනාගෙන ඇත.

**19.** 2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ හඳුනාගත් මුළු ආදායම සහ වෙනත් විස්තීරණ ආදායම කොපමණ ද?

| | **මුළු ආදායම (රු.'000)** | **වෙනත් විස්තීරණ ආදායම (රු.'000)** |
|---|---|---|
| (1) | 1 450 | 50 |
| (2) | 1 500 | 50 |
| (3) | 1 500 | 200 |
| (4) | 1 600 | 50 |
| (5) | 1 600 | 200 |

(……)

**20.** 2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මුළු විස්තීරණ ආදායම සහ රඳවාගත් ඉපැයුම් කොපමණ ද?

| | **මුළු විස්තීරණ ආදායම (රු.'000)** | **රඳවාගත් ඉපැයුම් (රු.'000)** |
|---|---|---|
| (1) | 950 | 950 |
| (2) | 1 000 | 800 |
| (3) | 1 000 | 950 |
| (4) | 1 100 | 900 |
| (5) | 1 100 | 1 050 |

(……)

**21.** පහත තොරතුරු සමාගමක් සතු වූ යන්ත්‍රයක් හා බැඳේ.

| | |
|---|---|
| පිරිවැය (රු.'000) | 6 000 |
| 2014.03.31 දිනට සමුච්චිත ක්ෂය (රු.'000) | 2 400 |
| අපේක්ෂිත සුන්බුන් අගය (රු.'000) | 400 |
| අපේක්ෂිත ඵලදායී ජීව කාලය (වසර) | 14 |

යන්ත්‍රයේ විශාල ප්‍රමාණයේ වැඩිදියුණු කිරීමක් සඳහා 2014.04.01 දින සමාගම රු. 1 800 000 ක් වැය කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ඉතිරි ඵලදායී ජීව කාලය වසර 10 ක් දක්වා වැඩි විය. කෙසේ වුව ද එහි සුන්බුන් අගය නොවෙනස්ව පැවතුනි.

2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා යන්ත්‍රයේ ක්ෂය සහ 2015.03.31 දිනට එහි ධාරණ වටිනාකම කොපමණ ද?

| | **ක්ෂය (රු.'000)** | **ධාරණ වටිනාකම (රු.'000)** |
|---|---|---|
| (1) | 100 | 4 500 |
| (2) | 100 | 4 900 |
| (3) | 320 | 3 280 |
| (4) | 500 | 4 500 |
| (5) | 500 | 4 900 |

(……)

**22.** සමාගමක ඉහළ ණයගැති පිරිවැටුම් අනුපාතයක් තුළින් පෙන්නුම් කෙරෙන්නේ කුමක් ද?

(1) එහි ණයගැතියන් ඉක්මනින් ගෙවීම් කරන බව ය.
(2) එහි ණයගැතියන් ඉක්මනින් ගෙවීම් නොකරන බව ය.
(3) එහි විකුණුම්වලින් වැඩි ප්‍රමාණයක් ණය පදනම මත සිදු කරන බව ය.
(4) එහි ණය එකතු කර ගැනීමේ කාලය වැඩි බව ය.
(5) එහි විකුණුම් වැඩි වන බව ය. (……)

**23.** සමාගමක ජංගම අනුපාතය සහ ක්ෂණික අනුපාතය පිළිවෙළින් වාර 1.2 ක් සහ වාර 0.8 ක් විය. අනෙකුත් සියලු සාධක නොවෙනස්ව තිබියදී භාණ්ඩ ණයට මිල දී ගැනීම තුළින් මෙම අනුපාත දෙකට ඇති වන බලපෑම කුමක් ද?

| | **ජංගම අනුපාතය** | **ක්ෂණික අනුපාතය** |
|---|---|---|
| (1) | වැඩි වේ | වැඩි වේ |
| (2) | වැඩි වේ | අඩු වේ |
| (3) | අඩු වේ | අඩු වේ |
| (4) | අඩු වේ | වැඩි වේ |
| (5) | වෙනසක් නොවේ | වෙනසක් නොවේ |

(......)

**24.** භාණ්ඩයක මුළු පිරිවැය සමාන වනුයේ:
(1) සෘජු පිරිවැය සහ නිෂ්පාදන පොදු කාර්යය පිරිවැයේ එකතුවට ය.
(2) සෘජු පිරිවැය සහ විචල්‍ය පොදු කාර්යය පිරිවැයේ එකතුවට ය.
(3) ප්‍රාථමික පිරිවැය සහ විචල්‍ය පොදු කාර්යය පිරිවැයේ එකතුවට ය.
(4) ප්‍රාථමික පිරිවැය සහ කාලච්ඡේද පිරිවැයේ එකතුවට ය.
(5) ප්‍රාථමික පිරිවැය, විචල්‍ය පොදු කාර්යය පිරිවැය සහ ස්ථාවර පොදු කාර්යය පිරිවැයේ එකතුවට ය. (......)

**25.** අයිතමයක නිෂ්පාදන ප්‍රමාණය අඩු වන විට, එහි ඒකක විචල්‍ය පිරිවැය:
(1) ස්ථාවරව පැවතේ.
(2) ස්ථාවර ප්‍රමාණයකින් වැඩි වේ.
(3) ස්ථාවර ප්‍රමාණයකින් අඩු වේ.
(4) නිෂ්පාදනයට සමානුපාතිකව වැඩි වේ.
(5) නිෂ්පාදනයට සමානුපාතිකව අඩු වේ. (......)

**26.** ආර්ථික ඇණවුම් ප්‍රමාණ (EOQ) ආකෘතියට අදාළ ව පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?
A - කරන ලද ඇණවුම් සංඛ්‍යාව සමග සෘජුව ම මුළු ඇණවුම් කිරීමේ පිරිවැය වෙනස් වේ.
B - සාමාන්‍ය තොග මට්ටම සමග තොග රඳවා ගැනීමේ මුළු පිරිවැය සෘජුව ම වෙනස් වේ.
C - ඇණවුමක ප්‍රමාණය වැඩි වන විට, එහි මුළු රඳවාගැනීමේ පිරිවැය අඩු වන අතර මුළු ඇණවුම් පිරිවැය වැඩි වේ.
(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි. (4) A හා C පමණි. (5) B හා C පමණි. (......)

**27.** සමාගමක් නිෂ්පාදනය කරන භාණ්ඩයකට අදාළ වන තොරතුරු පහත දැක්වේ.

| | **රු.'000** |
|---|---|
| භාවිත කළ සෘජු අමුද්‍රව්‍ය | 240 |
| සෘජු ශ්‍රමය | ? |
| නිෂ්පාදන පොදු කාර්යය පිරිවැය | ? |
| මුළු නිෂ්පාදන පිරිවැය | **600** |

නිෂ්පාදන පොදු කාර්යය පිරිවැය, සෘජු ශ්‍රම පිරිවැයෙන් 80% ක රේටයකට අන්තර්ග්‍රහනය කිරීම සමාගමේ ප්‍රතිපත්තිය වේ. මුළු නිෂ්පාදන පිරිවැයේ අඩංගු සෘජු ශ්‍රම පිරිවැය කොපමණ ද?
(1) රු. 72 000 (2) රු. 120 000 (3) රු. 200 000 (4) රු. 360 000 (5) රු. 480 000 (......)

**28.** ලී බඩු නිෂ්පාදන සමාගමක් 2015 මාර්තු මාසය තුළ දී පහත පිරිවැය දරන ලදී.

| | **රු.'000** |
|---|---|
| භාවිත කළ අමුද්‍රව්‍ය: | |
| දැව | 2 000 |
| ඇණ | 100 |
| තීන්ත | 400 |
| වේතන: | |
| වඩු කාර්මිකයෝ | 800 |
| නිෂ්පාදන සුපරීක්ෂකවරුන් | 400 |
| යන්ත්‍ර ක්ෂය | 300 |
| විකුණුම් කොමිස් | 200 |
| පරිපාලන සේවක වැටුප් | 300 |

More Past Papers at
tamilguru.lk

2015 මාර්තු මාසය සඳහා නිෂ්පාදිත පිරිවැය සහ කාලච්ඡේද පිරිවැය:

| | **නිෂ්පාදිත පිරිවැය (රු.'000)** | **කාලච්ඡේද පිරිවැය (රු.'000)** |
|---|---|---|
| (1) | 2 500 | 2 000 |
| (2) | 2 800 | 1 700 |
| (3) | 3 300 | 1 200 |
| (4) | 3 700 | 800 |
| (5) | 4 000 | 500 |

(......)

**29.** පහත තොරතුරු සමාගමක් නිෂ්පාදනය කරන භාණ්ඩයකට අදාළ වේ.

| | **රු.'000** |
|---|---|
| විකුණුම් | 1 200 |
| විචල්‍ය පිරිවැය | (600) |
| දායකය | **600** |
| ස්ථාවර පිරිවැය | (240) |
| ලාභය | **360** |

වර්තමාන ක්‍රියාකාරකම් මට්ටමේ දී සමච්ඡේදන ලක්ෂ්‍යය සහ ආරක්ෂිත ආන්තිකය රුපියල් වලින්:

| | සමච්ඡේදන ලක්ෂ්‍යය (රු.'000) | ආරක්ෂිත ආන්තිකය (රු.'000) |
|---|---|---|
| (1) | 120 | 1 080 |
| (2) | 180 | 1 020 |
| (3) | 480 | 720 |
| (4) | 600 | 600 |
| (5) | 800 | 400 |

(……)

**30.** සමාගමක්, නිෂ්පාදනය සඳහා භාවිත කරන පැරණි යන්ත්‍රය වෙනුවට අළුත් යන්ත්‍රයක් ආදේශ කිරීමට සලකා බලමින් සිටී. මෙම පැරණි යන්ත්‍රයේ මෙන් ම නව යන්ත්‍රයේ ද ඵලදායී ජීව කාලය වසර 4 කි. පහත තොරතුරු ද දී ඇත.

| විස්තරය | පැරණි යන්ත්‍රය (රු.'000) | නව යන්ත්‍රය (රු.'000) |
|---|---|---|
| ගැනුම් මිල | 9 000 | 10 000 |
| වර්තමාන විකුණුම් වටිනාකම | 4 000 | – |
| 4 වන වසර අවසානයේ දී අපේක්ෂිත සුන්බුන් අගය | – | 2 000 |
| වාර්ෂික මෙහෙයුම් පිරිවැය (ක්ෂය නොමැතිව) | 4 500 | 3 000 |

නව යන්ත්‍රය මිල දී ගන්නේ නම් ආරම්භක ශුද්ධ මුදල් ගලා යෑම සහ 4 වන වර්ෂයේ මුදල් ගලා ඒම:

| | ආරම්භක ශුද්ධ මුදල් ගලා යෑම (රු.'000) | 4 වන වර්ෂයේ මුදල් ගලා ඒම (රු.'000) |
|---|---|---|
| (1) | 5 000 | 3 500 |
| (2) | 6 000 | 1 500 |
| (3) | 6 000 | 3 500 |
| (4) | 10 000 | 1 500 |
| (5) | 10 000 | 3 500 |

(……)

● **ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉර මත ලියන්න.**

**31.** ආයතනයක කළමනාකරණ ගිණුම්කරණයේ කාර්යභාරයට අදාළ ව පහත ප්‍රකාශ **සත්‍ය** හෝ **අසත්‍ය** බව දක්වන්න.

| ප්‍රකාශය | සත්‍ය/අසත්‍ය |
|---|---|
| A - එය ආයතනයක කළමනාකරුවන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු සපයයි. | :.............................. |
| B - එය ආයතනයක් පිළිබඳ අතීත සහ අනාගත තොරතුරු සපයයි. | :.............................. |
| C - එය ගිණුම්කරණ ප්‍රමිත මගින් නියම කරන ලද තොරතුරු සපයයි. | :.............................. |
| D - එය ආයතනයක් පිළිබඳ ඇල්මක් දක්වන සියළු පාර්ශ්වයන්ට ඔවුන්ගේ ඉල්ලීම මත තොරතුරු සපයයි. | :.............................. |

**32.** රු. 500 000 ක මුදලක් ආයෝජනය කරමින් 2014.04.01 දින සුමුදු විසින් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. වර්ෂය තුළ දී සුමුදු රු. 200 000 ක් වටිනා ඵායා පිටපත් යන්ත්‍රයක් ව්‍යාපාරයට ලබා දුන් අතර ව්‍යාපාරයෙන් රු. 50 000 ක් ගැනිලි ලෙස ලබා ගන්නා ලදී. 2015.03.31 දිනෙන් අවසන් වර්ෂයේ දී ව්‍යාපාරය රු. 120 000 ක ලාභයක් උපයන ලදී.

(අ) 2015.03.31 දිනට ව්‍යාපාරයේ හිමිකම වැඩිවීමට දායක වන අයිතම **දෙක** (වටිනාකම සහිතව) සඳහන් කරන්න.

1. ....................................................... 2. ....................................................

(ආ) 2015.03.31 දිනට ව්‍යාපාරයේ ශුද්ධ වත්කම් කොපමණ ද? රු. ....................................................

**33.** පහත මූලික පොත්වලට අදාළ මූලාශ්‍ර ලියවිලි සඳහන් කරන්න.

| මූලික පොත | මූලාශ්‍ර ලියවිල්ල |
|---|---|
| A - විකුණුම් ජර්නලය | :.......................................... |
| B - පොදු ජර්නලය | :.......................................... |
| C - මුදල් ගෙවීම් ජර්නලය | :.......................................... |
| D - ආපසු යැවුම් ජර්නලය | :.......................................... |

**34.** දේපළ, පිරියත සහ උපකරණවලට අදාළ ව ව්‍යාපාරයක පොදු ජර්නලයේ සටහන් කරනු ලබන ගනුදෙනු හෝ සිද්ධි වර්ග **හතරක්** සඳහන් කරන්න.

1. ..........................................................................................................
2. ..........................................................................................................
3. ..........................................................................................................
4. ..........................................................................................................

**35.** ව්‍යාපාරයක 2015.03.31 දිනට බැංකු ගිණුමේ ශේෂය, එහි බැංකු ප්‍රකාශනයේ ශේෂයට වඩා වැඩි විය. (ව්‍යාපාරයේ බැංකු ගිණුමෙහි හෝ බැංකු ප්‍රකාශනයේ වැරදි නොතිබුණ බවට උපකල්පනය කරන්න).

මෙම වෙනසට හේතු විය හැකි කරුණු **දෙකක්** සඳහන් කරන්න.

1. ..........................................................................................................
2. ..........................................................................................................

[ගත්වැනි පිටුව බලන්න.

**36.** ලාභ ලැබීමේ පරමාර්ථයකින් තොර සංවිධානයක ලැබීම් හා ගෙවීම් ගිණුම සහ ආදායම් වියදම් ගිණුම අතර වෙනස පහත කරුණු මත පදනම් ව සඳහන් කරන්න.

| කරුණ | ලැබීම් හා ගෙවීම් ගිණුම | ආදායම් වියදම් ගිණුම |
|---|---|---|
| (අ) පිළියෙල කිරීමේ අරමුණ | .................................... | .................................... |
| (ආ) පිළියෙල කිරීමේ පදනම | .................................... | .................................... |

**37.** සීමිත අහමඩ් පොදු සමාගමේ විස්තීරණ ආදායම් ප්‍රකාශනයෙහි A, B, C සහ D යන අක්ෂරවලින් දක්වා ඇති පහත තොරතුරු ඉදිරිපත් කිරීමට අදාළ වන ගිණුම්කරණ සංකල්ප සඳහන් කරන්න.

සීමිත අහමඩ් පොදු සමාගම.................................................. A

2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය.............. B

රු.' 000 ...................... C

විකුණුම් අයභාරය XXX }

විකුණුම් පිරිවැය (XXX) } .................. D

**ගිණුම්කරණ සංකල්පය**

A - ........................................................

B - ........................................................

C - ........................................................

D - ........................................................

More Past Papers at
tamilguru.lk

**38.** ශ්‍රී ලංකාව තුළ අනුගමනය කරන 'මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට' අනුව වගකීමක ලක්ෂණ **තුන** සඳහන් කරන්න.

1. ........................................................................................................
2. ........................................................................................................
3. ........................................................................................................

**39.** පහත තොරතුරු 2014.04.01 දින ආරම්භ කරන ලද පාසල් බෑග් නිපදවන සුනිමල්ගේ ව්‍යාපාරය හා බැඳේ.

| **විස්තරය** | **රු.'000** |
|---|---|
| අමුද්‍රව්‍ය ගැනුම් | 500 |
| සෘජු වේතන | 200 |
| 2015.03.31 දිනට අමුද්‍රව්‍ය තොගය | 100 |
| 2015.03.31 දිනට නොනිමි ද්‍රව්‍ය තොගය (ප්‍රාථමික පිරිවැයට අගය කරන ලද) | 150 |
| නිෂ්පාදන පොදු කාර්යය පිරිවැය | 450 |

2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත දෑ ගණනය කරන්න:

(අ) ප්‍රාථමික පිරිවැය රු. .......................... (ආ) නිෂ්පාදන පිරිවැය රු. ..........................

**40.** හවුල් ව්‍යාපාරයක මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හිමිකම යටතේ ඉදිරිපත් කරනු ලබන අයිතම **දෙකක්** සඳහන් කරන්න.

1. .................................................... 2. ....................................................

**41.** ලාභාලාභ සමසමව බෙදා ගනිමින් පවත්වාගෙන යනු ලබන අශාන් සහ කුෂාන්ගේ හවුල් ව්‍යාපාරය හා පහත තොරතුරු බැඳේ.

**ජංගම ගිණුම් ශේෂයන්:**

| | **2015.03.31 දිනට (රු.'000)** | **2014.03.31 දිනට (රු.'000)** |
|---|---|---|
| අශාන් | 750 | 500 |
| කුෂාන් | 450 | 300 |

හවුල් ව්‍යාපාර ගිවිසුමට අනුව අශාන් රු. 150 000 ක වාර්ෂික වැටුපකට හිමිකම් ලබයි. වර්ෂය තුළ දී අශාන් සහ කුෂාන් පිළිවෙළින් රු. 100 000 ක් සහ රු. 50 000 ක් මුදලින් ලබා ගන්නා ලදී.

පහත දෑ ගණනය කරන්න:

(අ) 2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ලාභය රු. ..........................................

(ආ) 2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අශාන් සහ කුෂාන්ගේ ලාභ කොටස:

අශාන් රු. ...................... කුෂාන් රු. ......................

**42.** සමාගමක් 2015.03.31 දිනෙන් අවසන් වර්ෂයේ දී කොටසක් රු. 20 බැගින් සාමාන්‍ය කොටස් 200 000 ක් නිකුත් කරන ලදී. මුළු මුදල සමඟ කොටස් 300 000 ක් සඳහා අයදුම්පත් ලැබුණි. සමාගම රු. 50 000 ක් කොටස් නිකුත් කිරීමේ වියදම් ලෙස දරන ලදී. සමාගම කොටස් 200 000 සමානුපාතිකව විභජනය කරන ලද අතර අතිරික්ත මුදල් අයදුම්කරුවන් වෙත නැවත යවන ලදී.

පහත දෑ සඳහන් කරන්න:

(අ) කොටස් විභජනය කිරීම සටහන් කිරීම සඳහා ජර්නල් සටහන (*සංලක්ෂ්‍යය අවශ්‍ය නොවේ.*)

....................................................................................................

....................................................................................................

(ආ) ඉහත ගනුදෙනු නිසා වර්ෂය තුළ දී හිමිකමෙහි **ශුද්ධ වැඩි වීම** රු. ..........................

**43.** සුදුසු තීරුවේ '√' ලකුණක් යොදමින් නිෂ්පාදන සමාගමක පහත ගනුදෙනු තුළින් ඇති වන මුදල් ගලා ඒම LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) ප්‍රමිතයට අනුව මෙහෙයුම්, ආයෝජන සහ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ වර්ග කරන්න.

| ගනුදෙනුව | ක්‍රියාකාරකම්: මෙහෙයුම් | ආයෝජන | මූල්‍ය |
|---|---|---|---|
| A - සාමාන්‍ය කොටස් නිකුතුවෙන් මුදල් ලැබීම | ............... | ............... | ............... |
| B - වෙළෙඳ ණයගැතියන්ගෙන් මුදල් ලැබීම | ............... | ............... | ............... |
| C - මෝටර් රථයක් විකිණීමෙන් මුදල් ලැබීම | ............... | ............... | ............... |
| D - ස්ථාවර තැන්පතුවක් මත පොලිය ලැබීම | ............... | ............... | ............... |

**44.** LKAS 8 (ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ වැරදි) ප්‍රමිතයට අනුව සමාගමක පහත දැක්වෙන අවස්ථාවන් ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීමක් නිරූපණය කරයි ද යන්න සඳහන් කරන්න.

| අවස්ථාව | ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් (ඔව්/නැත) |
|---|---|
| A - ආරම්භක තොගය අධිගණනය වීම නිසා ලාභයෙහි ඇති වන වෙනස්වීම | ..................................... |
| B - වර්ෂය අවසානයේ ණයගැති ශේෂය මත අඩමාණ ණය වෙන් කිරීමේ අනුපාතය වෙනස්වීම | ..................................... |
| C - තොග තක්සේරු ක්‍රමය පෙර-පිවිසි පෙර-පිට (FIFO) ක්‍රමයේ සිට භරිත සාමාන්‍ය ක්‍රමයට වෙනස්වීම | ..................................... |
| D - ගොඩනැගිලිවල අපේක්ෂිත ඵලදායී ජීව කාලය වසර 30 සිට 35 දක්වා වෙනස්වීම | ..................................... |

- **ප්‍රශ්න අංක 45 සහ 46 ට පිළිතුරු සැපයීමට සමාගමකට අදාළ පහත තොරතුරු භාවිත කරන්න.**

| විස්තරය | රු.'000 |
|---|---|
| 2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා: | |
| ලාභය | 500 |
| පොලී වියදම | 150 |
| ආදායම් බදු වියදම | 100 |
| සාමාන්‍ය කොටස් මත අතුරු ලාභාංශ ගෙවීම | 300 |
| 2015.03.31 දිනට ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 1 800 |
| 2014.04.01 දිනට රඳවාගත් ඉපැයුම් | 2 500 |
| 2015.03.31 දිනට මුළු වත්කම් | 7 500 |

**45.** පහත දෑ ගණනය කරන්න:

(අ) පොලී ආවරණ අනුපාතය (වාර) ................................

(ආ) මුළු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය - වසර අග වත්කම් මත (%) ................................

**46.** පහත දෑ ගණනය කරන්න:

(අ) 2015.03.31 දිනට හිමිකම රු. ................................ (ආ) ණය අනුපාතය (%) ........................

**47.** පහත තොරතුරු සමාගමක් විසින් නිෂ්පාදනය කරන 'P' භාණ්ඩයට අදාළ වේ.

| | | |
|---|---|---|
| ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) | ඒකක | 200 |
| වාර්ෂික ඉල්ලුම | ඒකක | 8 000 |
| ඇණවුම් කිරීමේ පිරිවැය | ඇණවුමට | රු. 250 |
| රඳවා ගැනීමේ පිරිවැය | ඒකකයකට | රු. 100 |

පහත දෑ ගණනය කරන්න:

(අ) මුළු ඇණවුම් පිරිවැය රු. ......................... (ආ) මුළු රඳවා ගැනීමේ පිරිවැය රු. .........................

**48.** ඇඟළුම් කම්හලක යන්ත්‍ර ක්‍රියාකරවන්නකුට පැයකට රු. 50 ක් ගෙවනු ලබන අතර සෑම අතිකාල පැයකටම රු. 60 ක් ගෙවනු ලැබේ. සතියකට සාමාන්‍යයෙන් වැඩ කරන පැය ගණන 40 කි. 2015 මාර්තු මාසයේ පළමු සතිය තුළ දී යන්ත්‍ර ක්‍රියාකරු පැය 45 ක් වැඩ කර ඇත.

පහත දෑ ගණනය කරන්න:

(අ) 2015 මාර්තු මාසයේ පළමු සතිය සඳහා යන්ත්‍ර ක්‍රියාකරුගේ මුළු වේතනය රු. ............................

(ආ) යන්ත්‍ර ක්‍රියාකරුගේ වේතනය තුළ අඩංගු සෘජු ශ්‍රම පිරිවැය රු. ............................

**49.** තනි භාණ්ඩයක් නිෂ්පාදනය කරන සමාගමකට පහත තොරතුරු අදාළ වේ.

| ඒකකයක විචල්‍ය පිරිවැය: | | ස්ථාවර පිරිවැය: | |
|---|---|---|---|
| විකුණුම් සහ පරිපාලන | රු. 20 | විකුණුම් සහ පරිපාලන | රු. 120 000 |
| නිෂ්පාදන | රු. 40 | නිෂ්පාදන | රු. 150 000 |

සමාගම ඒකක 5 000 ක් නිෂ්පාදනය කර විකුණන ලද අතර එම ක්‍රියාකාරකම් මට්ටමේ දී රු. 180 000 ක ලාභයක් උපයන ලදී.

පහත දෑ ගණනය කරන්න:

(අ) ඒකකයක දායකය රු. ......................... (ආ) ඒකකයක විකුණුම් මිල රු. .............................

**50.** ඵලදායී ජීව කාලය වසර 5 ක් සහ සුන්බුන් අගය රු. 300 000 ක් වූ නව යන්ත්‍රයක් රු. 1 000 000 කට මිලදී ගැනීමට සමාගමක් සැලසුම් කරමින් සිටී. මෙම යන්ත්‍රයෙන් සෑම වර්ෂයකදී ම රු. 110 000 ක වාර්ෂික ලාභයක් ඉපැයීමට අපේක්ෂා කෙරේ. මෙම යන්ත්‍රයෙන් ජනනය වන මුදල් ප්‍රවාහයන් එහි ඵලදායී ජීව කාලය තුළ සමානව සිදුවේ යැ'යි ද අපේක්ෂා කෙරේ.

මෙම ව්‍යාපෘතිය සඳහා පහත දෑ ගණනය කරන්න:

(අ) 5 වන වර්ෂයේ ශුද්ධ මුදල් ප්‍රවාහය රු. ........................ (ආ) පිළිගෙවුම් කාලය (වසර) ...........................

* * *

66067

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2015

**ගිණුම්කරණය II**
கணக்கீடு II
Accounting II

**33 S II**

**පැය තුනයි**
*மூன்று மணித்தியாலம்*
*Three hours*

**උපදෙස් :**

※ **පළමුවන** හා **දෙවන** ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න **හයකට** පමණක් පිළිතුරු සපයන්න.
※ සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම **අලුත් කඩදාසියකින්** ආරම්භ කරන්න.
※ අදාළ පෙරවැඩ, පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.

**1.** 2015.03.31 දිනට සීමිත සාරංග පොදු සමාගමේ ශේෂ පිරික්සුම පහත දී ඇත.

| | හර (රු. '000) | බැර (රු. '000) |
|---|---|---|
| ගැනුම් | 7 500 | |
| කුලී | 960 | |
| වැටුප් | 1 000 | |
| මෝටර් රථ නඩත්තු වියදම් | 321 | |
| කල්බදු පොලී | 720 | |
| ප්‍රවර්තන වර්ෂයේ පළමු කාර්තු තුන සඳහා ගෙවූ ආදායම් බදු | 90 | |
| 2014.04.01 දිනට දේපළ, පිරියත සහ උපකරණ | 10 000 | |
| 2014.04.01 දිනට තොගය | 2 400 | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 3 000 | |
| බැංකුවේ ඇති මුදල් | 241 | |
| ත්‍රෛමාසික භාණ්ඩාගාර බිල්පත් (2015.03.31 දින ආයෝජනය කරන ලද) | 1 000 | |
| විකුණුම් | | 12 300 |
| 2014.04.01 දිනට ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | | 5 000 |
| 2014.04.01 දිනට රඳවාගත් ඉපැයුම් | | 1 794 |
| 2014.04.01 දිනට ඉඩමේ ප්‍රත්‍යාගණන සංචිතය | | 1 000 |
| කල්බදු ණයහිමියන් | | 1 788 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 4 000 |
| ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් (EPF) (10% සේවක දායකත්වය පමණි) | | 100 |
| 2014.04.01 දිනට සමුච්චිත ක්ෂය | | 1 000 |
| 2014.04.01 දිනට අඩමාණ ණය සඳහා වෙන්කිරීම | | 250 |
| | **27 232** | **27 232** |

**අතිරේක තොරතුරු:**

2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත දෑ සඳහා ගැළපීම් කළ යුතු වේ.

(i) 2014.04.01 දින සමාගමේ කාර්යාලය නව ස්ථානයකට ගෙන යන ලදී. මෙදින වසර දෙකක කුලී ගෙවන ලද අතර මුළු මුදලම ප්‍රවර්තන වර්ෂයේ කුලී ලෙස සටහන් කර ඇත.

(ii) 2014.04.01 දිනට දේපළ, පිරියත සහ උපකරණ සහ ඒවායේ සමුච්චිත ක්ෂයවල සංයුතිය පහත පරිදි වේ:

| **විස්තරය** | **පිරිවැය/වටිනාකම (රු.'000)** | **සමුච්චිත ක්ෂය (රු.'000)** |
|---|---|---|
| ඉඩම-සාධාරණ අගයට | 6 000 | – |
| මෝටර් රථය (කල්බදු පදනමට) | 3 000 | 600 |
| කාර්යාල උපකරණ | 1 000 | 400 |
| **එකතුව** | **10 000** | **1 000** |

සියලුම ක්ෂය කළ හැකි දේපළ, පිරියත සහ උපකරණ සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 20% බැගින් ක්ෂය කරනු ලබයි. ප්‍රවර්තන වර්ෂය සඳහා ක්ෂය වෙන් කළ යුතු වේ.

(iii) 2015.03.31 දින වෘත්තිය තක්සේරුකරුවකු විසින් ඉඩම රු. 4 500 000 කට ප්‍රත්‍යාගණනය කරන ලදී.

(iv) මෝටර් රථය 2013.04.01 දින මූල්‍ය කල්බද්දක් යටතේ වසර 4 ක කාලයකට භාණ්ඩ බෙදා හැරීම සඳහා අත්පත් කරගෙන ඇත. ගෙවිය යුතු වාර්ෂික කල්බදු වාරිකය රු. 720 000 කි. ප්‍රවර්තන වර්ෂයේ කල්බදු වාරිකය ගෙවා ඇති අතර එය කල්බදු පොලී ගිණුමට හර කර ඇත. ප්‍රවර්තන වර්ෂය සහ ඊළඟ වසර දෙක සඳහා අදාළ කල්බදු පොලී පහත පරිදි වේ.

| **වසර** | **පොලිය (රු.'000)** |
|---|---|
| 2014 / 2015 | 179 |
| 2015 / 2016 | 125 |
| 2016 / 2017 | 68 |

[ දෙවැනි පිටුව බලන්න.

(v) 2015.03.31 දිනට තොගයේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය පිළිවෙළින් රු. 1 800 000 ක් සහ රු. 2 000 000 ක් විය. කෙසේ වුව ද 2015.04.20 දින සම්පූර්ණ තොගය රු. 1 600 000 කට විකුණන ලදී. 2015.05.15 දින අධ්‍යක්ෂකවරුන් විසින් සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුමත කරන ලදී.

(vi) වසර අග වෙළෙඳ ලැබිය යුතු දැ ශේෂය මත 10% ක් අඩමාණ ණය සඳහා වෙන් කරනු ලැබේ.

(vii) පහත වියදම් විකුණුම් ගිණුමට හර කර ඇත.

| **අයිතමය** | **වටිනාකම (රු.'000)** |
|---|---|
| නියෝජිතයන් සඳහා විකුණුම් කොමිස් | 1 400 |
| වෙළෙඳ ලැබිය යුතු දැ සඳහා දුන් වට්ටම් | 300 |
| **එකතුව** | **1 700** |

(viii) රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනිත කරමින් කොටසක් රු. 10 බැගින් සාමාන්‍ය කොටස් 50 000 ක් දැනට සිටින කොටස්කරුවන්ට නිකුත් කර ඇත.

(ix) සමාගම විසින් මාස හයක වගකීම් සහතිකයක් සහිත ව භාණ්ඩ විකුණනු ලබයි. මෙම වගකීම් සහතිකය සඳහා විකුණුම් වටිනාකම මත 2% ක ප්‍රතිපාදනයක් කළ යුතු යැ'යි විශ්වසනීය ලෙස ඇස්තමේන්තු කර ඇත.

(x) සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාරකාර අරමුදල (ETF) සඳහා සමාගමේ දායකයන් මුළු වර්ෂය සඳහාම මෙතෙක් වෙන් කර නොමැත. EPF සහ ETF සඳහා සේවකයින්ගේ දළ වැටුප මත පිළිවෙළින් 15% ක් සහ 3% ක් බැගින් සමාගම දායක වේ.

(xi) ප්‍රවර්තන වර්ෂයේ ආදායම් බද්ද, බදු පෙර ලාභයෙන් 1/3 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

**අවශ්‍යවන්නේ:**

LKAS 1 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතයට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත සාරංග පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළුව):

(1) 2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය

(2) 2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

(3) 2015.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **(ලකුණු 20 යි)**

2. (අ) අංජු සහ සංජු 2014.04.01 දින හවුල් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. හවුල් ව්‍යාපාර ගිවිසුමේ කොන්දේසි පහත පරිදි වේ:

- අංජු සහ සංජු අතර ලාභාලාභ 2:1 අනුපාතයට බෙදා ගැනේ.
- සෑම හවුල්කරුවෙකුට ම රු. 40 000 ක මාසික වේතනයක් හිමි වේ.
- හවුල්කරුවන්ට ප්‍රාග්ධනය මත වාර්ෂික ව 10% ක පොලියක් හිමි වේ.
- හවුල්කරුවන් විසින් ලබාදෙන ණය සඳහා වාර්ෂික ව 6% ක පොලියක් හිමි වේ.
- හවුල්කරුවන්ට අදාළ සියලු ගනුදෙනු ඔවුන්ගේ ජංගම ගිණුම් මගින් වාර්තා කළ යුතු වේ.

2015.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම පහත පරිදි විය:

| | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ-ධාරණ වටිනාකමට .......... | 4 800 | |
| දේපළ, පිරියත සහ උපකරණ මත ක්ෂය .................... | 600 | |
| වෙළෙඳ ලැබිය යුතු දැ ...................................... | 900 | |
| බැංකුවේ ඇති මුදල් ........................................ | 130 | |
| ප්‍රාග්ධන ගිණුම් - අංජු.................................... | | 1 800 |
| - සංජු ...................................................... | | 1 300 |
| 2014.08.01 දින අංජු ලබා දුන් ණය ..................... | | 1 000 |
| වෙළෙඳ ගෙවිය යුතු දැ .................................... | | 340 |
| විකුණුම් ..................................................... | | 6 100 |
| ගැනුම් ....................................................... | 2 500 | |
| මෙහෙයුම් වියදම් ........................................... | 820 | |
| අංජුට ගෙවූ වැටුප් ........................................ | 200 | |
| අංජුගේ ණය මත ගෙවූ පොලී ............................. | 30 | |
| සංජුට ගෙවූ ප්‍රාග්ධන පොලී ............................. | 100 | |
| අංජුට ගෙවූ කුලී ........................................... | 100 | |
| නව කාර්යාලය සඳහා ගෙවූ කුලී........................... | 360 | |
| | **10 540** | **10 540** |

More Past Papers at
tamilguru.lk

**අතිරේක තොරතුරු:**

(i) අංජුට අයිති ගොඩනැගිල්ලක ව්‍යාපාරය ආරම්භ කරන ලදී. මේ සඳහා වාර්ෂික ව රු. 240 000 ක කුලියක් අංජුට ගෙවිය යුතු වේ. කෙසේ වුව ද ව්‍යාපාරය 2014.10.01 දින රු. 360 000 ක වාර්ෂික කුලියකට නව ස්ථානයකට ගෙන යන ලද අතර මෙම මුළු මුදල එදින ම ගෙවන ලදී.

(ii) තොග වාර්තාවලට අනුව, 2015.03.31 දින තොගයේ පිරිවැය රු. 250 000 කි. කෙසේ වුව ද අංජු සහ සංජු විසින් ලබා ගත් පිළිවෙළින් රු. 30 000 ක් සහ රු. 20 000 ක් පිරිවැය වූ භාණ්ඩ තොග වාර්තාවල ඇතුළත් කර නොමැත.

[තුන්වැනි පිටුව බලන්න.

(iii) 2015 අප්‍රේල් මාසයේ දී බෙදා හැරීමට එකඟවූ භාණ්ඩ වෙනුවෙන් ව්‍යාපාරය ලද රු. 100 000 ක අත්තිකාරමක් ප්‍රවර්තන වර්ෂයේ විකුණුම් ලෙස සටහන් කර ඇත.

(iv) හවුල් ව්‍යාපාරයේ සියලු මුදල් ගනුදෙනු බැංකු ගිණුමක් ආශ්‍රයෙන් සිදු කරනු ලැබේ. 2015.03.31 දිනට ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය, බැංකු ප්‍රකාශනයේ ශේෂය සමග එකඟ නොවී ය. පසු ව කරන ලද විමර්ශනයේ දී පහත දෑ හෙළිදරව් විය:

- ගනුදෙනුකරුවකු විසින් රු. 40 000 ක චෙක්පතක් බැංකුවේ සෘජු ව තැන්පත් කර තිබුණි.
- ගනුදෙනුකරුවකුගෙන් ලද රු. 60 000 ක චෙක්පතක් අගරු වී තිබුණි.
- සැපයුම්කරුවකුට නිකුත් කරන ලද රු. 50 000 ක චෙක්පතක් ගෙවීමට ඉදිරිපත් කර නොතිබුණි.
- අංජුගේ ජීවිත රක්ෂණ වාරිකය ගෙවීම සඳහා නිකුත් කළ රු. 10 000 ක චෙක්පත ව්‍යාපාරයේ බැංකු ගිණුමේ සටහන් කර නොතිබුණි.

**අවශ්‍යවන්නේ:**

(1) 2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය (හවුල්කරුවන්ට කරන ලද විසර්ජනයන් ද සහිත ව)

(2) 2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්

(3) 2015.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ බැංකුවේ ඇති මුදල් සහ වෙළෙඳ ලැබිය යුතු දෑවල නිවැරදි ශේෂයන්

**(ලකුණු 10 යි)**

(ආ) සමාගමකට එකලස් සහ නිමැවුම් යන නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් සහ නඩත්තු යන සේවා දෙපාර්තමේන්තුවක් ඇත. නිෂ්පාදන දෙපාර්තමේන්තු එකම ස්ථානයක පිහිටා ඇති අතර නඩත්තු දෙපාර්තමේන්තුව වෙනම ස්ථානගත කර ඇත. පහත අසම්පූර්ණ පොදු කාර්යය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව **නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙක** සඳහා පිළියෙල කර ඇත:

| පොදු කාර්යය පිරිවැය | විභජන පදනම | එකතුව (රු.'000) | එකලස් (රු.'000) | නිමැවුම් (රු.'000) |
|---|---|---|---|---|
| බෙදාහරින ලද නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | සෘජු | 9 800 | 5 000 | 4 800 |
| නිෂ්පාදන කළමනාකරුගේ වැටුප | | 6 000 | | |
| කුලිය | | 4 800 | | |
| විදුලිය | | 2 400 | | |
| යන්ත්‍ර ක්ෂය | | 6 000 | | |
| සේවක සුබසාධන වියදම් | | 3 000 | | |

**අතිරේක තොරතුරු:**

(i) එකලස් සහ නිමැවුම් දෙපාර්තමේන්තු අතර පොදු කාර්යය පිරිවැය විභජන පදනම්:

- නිෂ්පාදන කළමනාකරුගේ වැටුප සමාන ව බෙදා හැරේ.
- අනෙකුත් පදනම්:

| විස්තරය | එකලස් | නිමැවුම් | එකතුව |
|---|---|---|---|
| බිම් ප්‍රමාණය (වර්ග මීටර) | 20 000 | 10 000 | 30 000 |
| කිලෝවොට් පැය | 40 000 | 20 000 | 60 000 |
| යන්ත්‍ර වටිනාකම (රු.'000) | 50 000 | 10 000 | 60 000 |
| සේවකයන් ගණන | 50 | 100 | 150 |
| නඩත්තු පැය | 20 000 | 80 000 | 100 000 |

(ii) නඩත්තු දෙපාර්තමේන්තුවට බෙදා හැර ඇති මුළු පොදු කාර්යය පිරිවැය රු. 6 000 000 කි. මෙය නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙක අතරේ නඩත්තු පැය මත පදනම් ව විභජනය කළ යුතු ය.

(iii) එකලස් දෙපාර්තමේන්තුව සහ නිමැවුම් දෙපාර්තමේන්තුව පොදු කාර්යය පිරිවැය අන්තර්ග්‍රහනය සඳහා පිළිවෙළින් යන්ත්‍ර පැය සහ ශ්‍රම පැය යොදා ගැනේ. එකලස් දෙපාර්තමේන්තුව සඳහා අයවැයගත යන්ත්‍ර පැය 400 000 ක් වන අතර නිමැවුම් දෙපාර්තමේන්තුව සඳහා අයවැයගත ශ්‍රම පැය 200 000 ක් වේ.

(iv) පහත තොරතුරු සමාගම විසින් නිෂ්පාදනය කරන 'A' භාණ්ඩයට අදාළ වේ.

| | |
|---|---|
| අයවැයගත නිෂ්පාදනය | ඒකක 1 000 |
| ඒකකයක විකුණුම් මිල | රු. 2 500 |
| ඒකකයක ප්‍රාථමික පිරිවැය | රු. 500 |
| ඒකකයක් නිෂ්පාදනය සඳහා අයවැයගත පැය: | |
| - යන්ත්‍ර පැය | 3 |
| - ශ්‍රම පැය | 5 |
| අයවැයගත නිෂ්පාදන නොවන පොදු කාර්යය පිරිවැය: | |
| - ඒකකයක විචල්‍ය පොදු කාර්යය පිරිවැය | රු. 300 |
| - ස්ථාවර පොදු කාර්යය පිරිවැය | රු. 400 000 |

[හතරවැනි පිටුව බලන්න.

අවශ්‍යවන්නේ:

(1) නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙක සඳහා සම්පූර්ණ කරන ලද පොදු කාර්යය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව
(2) එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුව සඳහා පොදු කාර්යය පිරිවැය අන්තර්ග්‍රහන අනුපාත
(3) 'A' භාණ්ඩයෙන් අපේක්ෂිත ලාභය හෝ අලාභය දක්වන ප්‍රකාශනයක්

**(ලකුණු 10 යි)**

**(මුළු ලකුණු 20 යි)**

**3.** නාරද 2015.03.01 දින රු. 150 000 ක් මුදල් ආයෝජනය කරමින් ඔහුගේ නිවසේ කොටසක ලිපිද්‍රව්‍ය අලෙවිසැලක් ආරම්භ කරන ලදී. තවද ඔහු ව්‍යාපාරයේ භාවිතය සඳහා රු. 60 000 ක් වටිනා ලී බඩු එදිනම ගෙන එන ලදී. ඔහු ව්‍යාපාරයේ නමින් බැංකු ගිණුමක් ආරම්භ කරන ලද අතර සියලු මුදල් ගනුදෙනු එම ගිණුම තුළින් සිදු කරන ලදී. පහත ගනුදෙනු පළමු මෙහෙයුම් මාසය තුළ දී සිදු විය.

| ගනුදෙනු අංකය | ගනුදෙනුව |
|---|---|
| 1 | රු. 100 000 ක ලිපිද්‍රව්‍ය අයිතම අත්පිට මුදලට මිල දී ගන්නා ලදී. |
| 2 | රු. 70 000 ක් පිරිවැය වූ ලිපිද්‍රව්‍ය අයිතම රු. 100 000 ක අත්පිට මුදලට විකුණන ලදී. |
| 3 | රු. 150 000 ක ලිපිද්‍රව්‍ය අයිතම ණයට මිල දී ගන්නා ලදී. |
| 4 | රු. 30 000 ක ලිපිද්‍රව්‍ය අයිතම දෝෂ සහිත නිසා සැපයුම්කරුට ආපසු යවන ලදී. |
| 5 | 2015.03.15 දින රු. 120 000 කට පරිගණක යන්ත්‍රයක් ණයට මිල දී ගන්නා ලදී. මෙම මුදල මාස 18 ක කාලයක් තුළ ගෙවිය යුතු ය. |
| 6 | රු. 100 000 ක් පිරිවැය වූ ලිපිද්‍රව්‍ය අයිතම රු. 140 000 කට ණයට විකුණන ලදී. |
| 7 | රු. 15 000 ක් වූ කාර්යාල සහකරුගේ මාසික වැටුප ගෙවන ලදී. |
| 8 | නාරදගේ පෞද්ගලික භාවිතයට රු. 30 000 ක් ව්‍යාපාරයෙන් ලබා ගන්නා ලදී. |
| 9 | ගෙවිය යුතු ශේෂය මත 5% ක වට්ටමකට යටත් ව ලිපිද්‍රව්‍ය සැපයුම්කරුට ගෙවිය යුතු මුදල ගෙවන ලදී. |
| 10 | 5% ක වට්ටමක් අඩු කිරීමෙන් පසුව ණයගැතියන්ගෙන් ලැබිය යුතු මුදල ලබා ගන්නා ලදී. |

අතිරේක තොරතුරු:

- 2015 මාර්තු මාසය සඳහා රු. 3 000 ක් වූ ව්‍යාපාරයේ දුරකථන ගාස්තු බිල 2015.04.02 දින ලැබුණි.
- ව්‍යාපාරයේ දේපළ, පිරියත සහ උපකරණ වාර්ෂිකව 20% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතු වේ.

අවශ්‍යවන්නේ:

(1) ඉහත අංක 1 සිට 10 දක්වා ගනුදෙනුවල බලපෑම (අගයන් සහිත ව) ගිණුම්කරණ සමීකරණය භාවිත කරමින් පෙන්නුම් කර, එක් එක් අගය ඉදිරියෙන් එය වැඩි වේ නම් (+) ද, අඩු වේ නම් (–) ද යන්න සඳහන් කිරීම
(මේ සඳහා පහත ආකෘතිය භාවිත කරන්න.)

රු.'000

| ගනුදෙනු අංකය | වත්කම් | | | | වගකීම් | | හිමිකම |
|---|---|---|---|---|---|---|---|
| | දේපළ, පිරියත සහ උපකරණ | තොගය | වෙළෙඳ ලැබිය යුතු දෑ | බැංකු | වෙළෙඳ ගෙවිය යුතු දෑ | ණය | |
| | | | | | | | |

(2) 2015.03.31 දිනෙන් අවසන් මාසය සඳහා ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය
(3) පහත ආකෘතිය භාවිත කරමින් 2015.03.31 දිනට ව්‍යාපාරයේ හිමිකමේ සංයුතිය:

රු.'000

| | |
|---|---|
| ආරම්භක ප්‍රාග්ධනය | |
| කාලච්ඡේදය සඳහා ලාභය/(අලාභය) | |
| අඩුකලා: ගැනිලි | |
| 2015.03.31 දිනට හිමිකම | |

More Past Papers at
tamilguru.lk

**(මුළු ලකුණු 15 යි)**

**4.** (අ) පහත තොරතුරු සමාගමක් භාවිත කරන අමුද්‍රව්‍යයකට අදාළ වේ.

(i) 2015 මාර්තු මාසය සඳහා තොග ලෙජරයේ සාරාංශය:

| දිනය | විස්තරය | ප්‍රමාණය (ඒකක) | ඒකකයක මිල (රු.) |
|---|---|---|---|
| 2015.03.01 | ශේෂය | 4 000 | 12 |
| 2015.03.10 | ගැනුම් | 8 000 | 15 |
| 2015.03.20 | නිකුත් කිරීම් | 7 000 | ? |
| 2015.03.25 | ගැනුම් | 8 000 | 20 |
| 2015.03.31 | ශේෂය | 13 000 | |

(ii) තොග නිකුත් කිරීම් මිල කිරීම සඳහා සමාගම භරිත සාමාන්‍ය ක්‍රමය භාවිත කරයි.

[පස්වැනි පිටුව බලන්න.

(iii) වෙනත් තොරතුරු:

| | පරිභෝජනය (මාසයකට ඒකක) | පොරොත්තු කාලය (මාස) |
|---|---|---|
| උපරිම | 3 000 | 4 |
| අවම | 1 000 | 2 |

**අවශ්‍යවන්නේ:**

(1) යළි ඇණවුම් ප්‍රමාණය
(2) 2015.03.20 දින නිකුත් කළ තොගයේ වටිනාකම
(3) යළි ඇණවුම් මට්ටම
(4) උපරිම තොග මට්ටම
(5) අවම තොග මට්ටම

**(ලකුණු 05 යි)**

(ආ) පෞද්ගලික ඉතුරුම්වලින් රු. 600 000 ක් ආයෝජනය කරමින් 2015.03.01 දින සිතුම් විසින් වෙළෙඳ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. 2015 මාර්තු මාසය තුළ සිදු කරන ලද ගනුදෙනුවල සාරාංශයක් පහත දී ඇත.

(i) මුදල් ලැබීම් සහ ගෙවීම්:

| | රු. '000 |
|---|---|
| **ලැබීම්:** | |
| විකුණුම් | 1 800 |
| ණයගැතියන්ගෙන් ලද මුදල් | 5 600 |
| **ගෙවීම්:** | |
| ගැනුම් | 1 200 |
| ණයහිමියන්ට ගෙවූ මුදල් | 3 400 |
| වියදම් | 1 400 |

(ii) ණයහිමියන්ගෙන් රු. 400 000 ක මුදල් වට්ටමක් ලැබුණු අතර ණයගැතියන්ට රු. 200 000 ක මුදල් වට්ටමක් දෙන ලදී.

(iii) අනෙකුත් මූලික පොත්වල එකතුන්:

| මූලික පොත | එකතුව (රු. '000) |
|---|---|
| ගැනුම් ජර්නලය | 10 800 |
| විකුණුම් ජර්නලය | 10 000 |
| ආපසු යැවුම් ජර්නලය | 300 |
| ආපසු එවුම් ජර්නලය | 200 |

(iv) 2015.03.31 දිනට ණයහිමි පාලන ගිණුමේ සහ ණයගැති පාලන ගිණුමේ ශේෂයන් අදාළ උප ලෙජර ශේෂයන්ගේ එකතුන් සමග එකඟ නොවී ය. පසුව කරන ලද විමර්ශනයේ දී පහත දෑ හෙළිදරව් විය:

1. රු. 1 800 000 කට ලොරියක් ණයට මිල දී ගැනීම ගැනුම් ජර්නලයේ සටහන් කර තිබුණි.
2. මාසය තුළ දී රු. 100 000 ක් බොල් ණය ලෙස කපා හැරීම ණයගැති පාලන ගිණුමේ සටහන් කර නොතිබුණි.
3. ආපසු එවුම් ජර්නලයේ එකතුව වූ රු. 200 000, ණයගැති පාලන ගිණුමේ රු. 2 000 000 ක් ලෙස සටහන් කර තිබුණි.

**අවශ්‍යවන්නේ:**

(1) 2015 මාර්තු මාසය සඳහා මුදල් ලැබීම් ජර්නලය සහ මුදල් ගෙවීම් ජර්නලය
(2) වැරදි නිවැරදි කිරීමට ජර්නල් සටහන් *(සංලක්ෂ්‍යය අවශ්‍ය වේ)*
(3) වැරදි නිවැරදි කිරීමෙන් පසු ණයහිමි පාලන ගිණුම සහ ණයගැති පාලන ගිණුම

**(ලකුණු 10 යි)**
**(මුළු ලකුණු 15 යි)**

5. (අ) පහත තොරතුරු සීමිත පර්ල් පොදු සමාගමට අදාළ වේ.

| විස්තරය | 2015.03.31 දිනට (රු.'000) | 2014.03.31 දිනට (රු.'000) |
|---|---|---|
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 540 | 420 |
| තොගය | 1 800 | 2 200 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 660 | 380 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 1 200 | 1 800 |
| ගෙවිය යුතු පොලී | 300 | 200 |

| 2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා: | රු.'000 |
|---|---|
| මුළු විකුණුම් | 8 000 (මෙයින් 60% ක් ණයට විකුණුම් ය.) |
| ගැනුම් | 3 600 |
| ලාභය | 2 400 |

වර්ෂයකට වැඩ කරන දින 360 ක් ලෙස උපකල්පනය කරන්න.

[හයවැනි පිටුව බලන්න.

**අවශ්‍යවන්නේ:**

2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා,

(1) ශුද්ධ ලාභ අනුපාතය

(2) දළ ලාභ අනුපාතය

(3) ජංගම අනුපාතය

(4) වෙළෙඳ ලැබිය යුතු දෑ (ණයගැති) පිරිවැටුම් අනුපාතය

(5) තොග රැඳවුම් කාලය

**(ලකුණු 05 යි)**

(ආ) නාගෙන්ද්‍රන් මහතා කොළඹ පෞද්ගලික පාසලක් ආරම්භ කිරීමට සැලසුම් කරමින් සිටී. මෙම පාසලේ අපේක්ෂිත ආදායම් සහ පිරිවැය පහත පරිදි වේ:

සිසුවකුගෙන් ගාස්තු:

| | | |
|---|---|---|
| ලියාපදිංචි ගාස්තු | වර්ෂයකට | රු. 12 000 |
| පහසුකම් ගාස්තු | වර්ෂයකට | රු. 12 000 |
| පාඨමාලා ගාස්තු | මාසිකව | රු. 10 000 |

පිරිවැය:

| | | |
|---|---|---|
| පාඨමාලා අත්පොත් මුද්‍රණය | සිසුවකුට මාසිකව | රු. 4 000 |
| ලිපිද්‍රව්‍ය | සිසුවකුට මාසිකව | රු. 3 000 |
| ක්‍රීඩා වියදම් | සිසුවකුට මාසිකව | රු. 1 000 |
| ගොඩනැගිල්ල සඳහා කුලී | මාසිකව | රු. 40 000 |
| වැටුප් | මාසිකව | රු. 30 000 |
| ප්‍රචාරණ සහ ප්‍රවර්ධන | මාසිකව | රු. 10 000 |

More Past Papers at
tamilguru.lk

**අවශ්‍යවන්නේ:**

(1) එක් සිසුවකු මත වාර්ෂික දායකය

(2) පාසලේ වාර්ෂික මුළු ස්ථාවර පිරිවැය

(3) මුළු වාර්ෂික පිරිවැය ආවරණය කිරීම සඳහා බඳවා ගත යුතු සිසුන් ගණන

(4) රු. 240 000 ක ලාභයක් ඉපැයීමට බඳවා ගත යුතු සිසුන් ගණන

(5) සිසුන් 50 ක් බඳවා ගන්නා අතර ඉන් 10 දෙනකුගේ පාඨමාලා ගාස්තු අය නොකරන්නේ නම් අපේක්ෂිත ලාභය හෝ අලාභය

**(ලකුණු 10 යි)**

**(මුළු ලකුණු 15 යි)**

6. සීමිත සුමුදු පොදු සමාගමේ 2015.03.31 සහ 2014.03.31 දිනවලට සාරාංශගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත දී ඇත.

| | **2015.03.31 දිනට (රු.'000)** | **2014.03.31 දිනට (රු.'000)** |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ - පිරිවැයට | 19 600 | 13 100 |
| දේපළ, පිරියත සහ උපකරණ - සමුච්චිත ක්ෂය | (3 800) | (2 800) |
| තොගය | 1 500 | 1 400 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 1 600 | 1 800 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 400 | 500 |
| **මුළු වත්කම්** | **19 300** | **14 000** |
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 9 500 | 8 000 |
| රඳවාගත් ඉපැයුම් | 5 500 | 4 400 |
| ඉඩම සඳහා ණය | 2 400 | – |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 1 750 | 1 600 |
| ණය මත ගෙවිය යුතු පොළී | 150 | – |
| **මුළු වගකීම් සහ හිමිකම** | **19 300** | **14 000** |

**අතිරේක තොරතුරු:**

(i) වර්ෂය තුළ දී පිරිවැය රු. 1 000 000 ක් වූ කාර්යාල උපකරණ රු. 300 000 ක අත්පිට මුදලට විකුණන ලදී. විකුණූ දිනයේ දී මෙම උපකරණවල ධාරණ වටිනාකම රු. 600 000 ක් විය.

(ii) 2014.04.01 දින රු. 3 000 000 ක් වටිනා ඉඩමක් ණයට මිල දී ගන්නා ලදී. මෙම ණය මුදල රු. 600 000 බැගින් වූ සමාන වාරික 5 කින් ප්‍රවර්තන වර්ෂයේ සිට ගෙවිය යුතු වේ. තව ද මූලික ණය මුදල මත 5% ක වාර්ෂික පොලියක් ගෙවිය යුතු වේ.

(iii) වර්ෂය තුළ අත්පත් කර ගත් අනෙකුත් සියලු දේපළ, පිරියත සහ උපකරණ අත්පිට මුදලට මිල දී ගෙන ඇත.

(iv) වර්ෂය තුළ දී රු. 400 000 ක අතුරු ලාභාංශයක් ගෙවා ඇත.

(v) වර්ෂය තුළ දී නිකුත් කළ සාමාන්‍ය කොටස්වල සංයුතිය පහත පරිදි වේ:

| නිකුතුවේ වර්ගය | වටිනාකම (රු.'000) |
|---|---|
| හිමිකම් කොටස් නිකුතුව | 1 000 |
| රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනිත කරමින් නිකුත් කළ කොටස් | 500 |
| **එකතුව** | **1 500** |

කොටස්කරුවන් විසින් සියලු හිමිකම් ලබා ගන්නා ලද අතර මුදල් නියමිත පරිදි ලැබිණි.

(vi) සමාගම බදු නිදහස් කාලයක් තුළ ක්‍රියාත්මක වේ.

**අවශ්‍යවන්නේ:**

(1) LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) ප්‍රමිතයට අනුව 2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත සුමුදු පොදු සමාගමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

(2) කාර්යාල උපකරණ ඉවත් කිරීමේ ගිණුම

**(මුළු ලකුණු 15 යි)**

7. (අ) සමාගමක් මුද්‍රණාලයක් ආරම්භ කිරීමට සැලසුම් කරමින් සිටී. මේ සඳහා අවශ්‍ය කරන මුද්‍රණ යන්ත්‍රය මිල දී ගැනීමට අදාළ මුදල් ප්‍රවාහ පහත දැක්වේ:

| | රු. '000 |
|---|---|
| ගැනුම් මිල | 2 000 |
| වැඩ බිම සකස් කිරීමේ වියදම් | 200 |
| සවිකිරීමේ ගාස්තු | 300 |

යන්ත්‍රයේ අපේක්ෂිත සුන්බුන් අගය සහ ඵලදායී ජීව කාලය පිළිවෙළින් රු. 500 000 ක් සහ වසර 4 ක් වේ.

ව්‍යාපෘතිය ආරම්භයේ දී රු. 500 000 ක කාරක ප්‍රාග්ධනයක් අවශ්‍ය වන අතර එය ව්‍යාපෘතිය අවසානයේ දී නැවත ලබා ගත හැකි ය.

මුද්‍රණාලයෙන් අපේක්ෂිත ආදායම සහ මෙහෙයුම් වියදම් පහත පරිදි වේ:

රු. '000

| වසර | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|
| ආදායම | 3 500 | 4 500 | 6 000 | 7 500 |
| මෙහෙයුම් වියදම් (ක්ෂය ද ඇතුළුව) | 2 000 | 3 000 | 3 500 | 4 000 |

ව්‍යාපෘතියේ 10% ක අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය මත වට්ටම් සාධක (පළමු දශමස්ථානයට):

| වසර | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|
| වට්ටම් සාධකය | 0.9 | 0.8 | 0.7 | 0.6 |

**අවශ්‍යවන්නේ:**

ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත දෑ:

(1) අන්තර්ගත අයිතම වෙන වෙන ම දක්වමින් ආරම්භක මුළු මුදල් ගලා යෑම

(2) වසර 1 සිට 4 දක්වා වාර්ෂික මුදල් ගලා ඒම් සහ මුදල් ගලා යෑම්

(3) ශුද්ධ වර්තමාන අගය

(4) ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය මත පදනම් ව එහි යෝග්‍යතාව පිළිබඳ නිර්දේශය **(ලකුණු 05 යි)**

(ආ) රන්තරු ක්‍රීඩා සමාජයේ 2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් සහ ගෙවීම් ගිණුම පහත පරිදි විය:

**ලැබීම් සහ ගෙවීම් ගිණුම (රු.'000)**

| | | | |
|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | 80 | ප්‍රේක්ෂකාගාරය නවීකරණය කිරීම | 300 |
| ක්‍රීඩා උපකරණ සඳහා පරිත්‍යාගය | 500 | වැටුප්: | |
| සාමාජික මුදල් | 390 | - ක්‍රීඩාංගන භාරකරු | 360 |
| ඇතුළත් වීමේ ගාස්තු | 120 | - කළමනාකරු | 240 |
| ක්‍රීඩා පිටිය කුලියට දීමේ ගාස්තු | 660 | කාර්යාල වියදම් | 50 |
| | | ක්‍රීඩා පිටිය නඩත්තු කිරීම | 150 |
| | | ක්‍රීඩා උපකරණ | 500 |
| | | ශේෂය ප/ගෙ | 150 |
| | **1 750** | | **1 750** |

**අතිරේක තොරතුරු:**

(i) 2014.04.01 දිනට පැවති දේපළ, පිරියත සහ උපකරණවලට පහත තොරතුරු අදාළ වේ:

| | පිරිවැය (රු.'000) | සමුච්චිත ක්ෂය (රු.'000) | අපේක්ෂිත ඵලදායී ජීව කාලය (වසර) |
|---|---|---|---|
| ක්‍රීඩා පිටිය | 2 000 | – | – |
| ප්‍රේක්ෂකාගාරය | 1 500 | 750 | 20 |
| ක්‍රීඩා උපකරණ | 500 | 300 | 5 |

(ii) 2014.04.01 දින ප්‍රේක්ෂකාගාරය නවීකරණය කිරීම සම්පූර්ණ කරන ලද අතර එදින සිට එය භාවිතයට ගන්නා ලදී. මෙම වටිනාකම ප්‍රේක්ෂකාගාර ගිණුමේ මේ දක්වා හඳුනාගෙන නොමැත. තව ද මෙදින සිට ප්‍රේක්ෂකාගාරයේ ඉතිරි ඵලදායී ජීව කාලය වසර 15 ක් දක්වා වැඩි වී ඇත.

(iii) 2014.04.01 දින ක්‍රීඩා උපකරණ මිල දී ගැනීම සඳහා මුදල් පරිත්‍යාගය ලද අතර මෙම අයිතම 2014.10.01 දින මිල දී ගන්නා ලදී. මෙම උපකරණවල අපේක්ෂිත ඵලදායී ජීව කාලය වසර 5 කි. පරිත්‍යාග ලද වසරේ සිට වසර 5 ක් තුළ ආදායමෙහි හඳුනා ගැනීම ක්‍රීඩා සමාජයේ ප්‍රතිපත්තිය වේ.

(iv) සාමාජිකයකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 6 000 කි. 2014.04.01 දින ක්‍රීඩා සමාජයේ සාමාජිකයින් ගණන 40 ක් විය. මෙදින තවත් සාමාජිකයින් 10 දෙනෙකු බැඳුනු අතර ඔවුන් වසර දෙකක සාමාජික මුදල් එකවර ගෙවන ලදී. ප්‍රවර්තන වර්ෂයේ ලද සාමාජික මුදල් තුළ 2013/2014 වර්ෂය සඳහා ලද රු. 30 000 ක් ද අන්තර්ගත වේ. 2015.03.31 දිනට ලැබිය යුතු සාමාජික මුදල් නොමැත.

(v) එක් ක්‍රීඩා උත්සවයක් සඳහා රු. 300 000 ක් අයකරමින් ක්‍රීඩා පිටිය බාහිර පාර්ශ්වයන්ට කුලියට දෙනු ලැබේ. මෙම මුදලින් 60% ක් අත්තිකාරමක් ලෙස ක්‍රීඩා පිටිය වෙන් කරන අවස්ථාවේ දී ද, ඉතිරිය ක්‍රීඩා උත්සව දිනයේ දී ද ගෙවිය යුතුවේ. මෙම ක්‍රීඩා උත්සවවල විස්තර පහත පරිදි වේ.

| **උත්සව අංකය** | **උත්සවයේ අදියර** | **ප්‍රවර්තන වර්ෂය තුළ මුදල් ලැබීම්** |
|---|---|---|
| 1 | 2014.07.01 දින නිම කරන ලදී. | අත්තිකාරම ද ඇතුළුව මුළු මුදලම ලැබුණි. |
| 2 | 2014.11.08 දින නිම කරන ලදී. | අත්තිකාරම පමණක් ලැබුණි. |
| 3 | 2015 අප්‍රේල් මාසයේ පළමු සතියේ දී පැවැත්වේ. | 2015 මාර්තු මාසය තුළ අත්තිකාරම ලැබුණි. |

**අවශ්‍යවන්නේ:**

රන්තරු ක්‍රීඩා සමාජය සඳහා පහත දෑ:

(1) 2014.04.01 දිනට සමුච්චිත අරමුදල

(2) 2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

(3) 2015.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

**( ලකුණු 10 යි)**
**(මුළු ලකුණු 15 යි)**

* * *

More Past Papers at
tamilguru.lk